# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2024 ජුනි මස 28 වන දින II වන කොටස**

**අතිරේකය**

**(2024.07.01 දින නිකුත් කරන ලදී)**


# මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

## මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සමන්ප්‍රිය හේරත් මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 24.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) මේ පනතේ විධිවිධානවලට සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතීන්ට යටත්ව සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමණාකරණය සහ පරිපාලනය 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ධුර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින්මතු " මණ්ඩලය " යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

(2) (අ) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ ධුර දරන සාමාජිකයන් විසින් (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීතීන්ට යටත්ව, (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුලත සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් දක්වා ඇති ආකාරයට සංස්ථාපිත මණ්ඩලයේ පළමු මණ්ඩලය පත් කරනු ලැබූ හෝ තෝරා පත් කරනු ලැබූ දින තෙක්, සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලයක් වශයෙන් කටයුතු කළ යුතු ය;

(ආ) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූල නොවන පරිදි සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සඳහා රීති සෑදීමට සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලයට බලය ඇත්තේ ය;

(ඇ) යම් රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරයක් විසින් අතුරු මණ්ඩලයේ යම් තීරණයක් ගනු ලැබිය යුතු ය; සහ

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට අවුරුද්දක කාලයක් ඇතුලත සංස්ථාපිත මණ්ඩලයේ පළමු මණ්ඩලය පත් කරනු ලැබීම හෝ තෝරා පත් කරනු ලැබීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ද ඇතුලුව මණ්ඩලයේ සෑම ධුර දරන්නෙක්ම අවුරුදු තුනක කාලයක් සඳහා පත්කරගත යුතු හෝ තෝරා පත් කරගත යුතු අතර,එම අවුරුදු තුනක කාලසීමාව ඉකුත්

වීමෙන් පසුව එම ධුර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත් කර ගැනීම හෝ තෝරා පත් කර ගැනීම සඳහා සුදුස්සෙකු විය යුතු ය;

(ආ) යම් ධුර දරන්නෙකු මියයාම, ඉල්ලා අස්වීම, යම් අශක්නුතාවයකට පත් වීම හෝ ධූරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවකදී සංස්ථාපිත මණ්ඩල විසින් සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තෙකු තෝරා පත් කර ගැනීම හෝ පත් කර ගැනීම කළ යුතුය.

(4) මෙම පනතේ විධි විධානවලට යටත්ව කලින් කලට අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණ මත;

(අ) සාමාජිකත්වය සඳහා සුදුසු යම් පුද්ගලයෙක් බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන නිර්ණායක සම්බන්ධව;

(ආ) සාමාජිකයන්ගේ විවිධ පන්ති / කොටස්වලට (ගෞරවනීය සාමාජිකයන් ද ඇතුළත්ව) වෙන් කිරීම සම්බන්ධව;

(ඇ) සාමාජිකයන්ගේ ඡන්දය ලබා දීමක් වෙතොත් එයට ඇති අයිතිය ද ඇතුළත්ව අයිතිවාසිකම් සහ වගකීම සම්බන්ධව;

(ඈ) සාමාජිකත්වය අවසන් වන තත්වයන් සහ අවසන් වන්නේ කෙසේද යන්න සම්බන්ධව තීරණ ගත යුතුය.

(5) අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙක් සංස්ථාපිත මණ්ඩලයේ හෝ සංස්ථාපිත මණ්ඩලයේ ඕනෑම කාර්යාලයක ගෙවීම් සිදු කරන මධ්‍යස්ථානය මගින් වැටුප් හෝ වෙනත් මූල්‍යමය වාසි මධ්‍යස්ථානය වෙනුවෙන් දරන ලද වියදම් ප්‍රතිපූරණය කිරීම හැර අධ්‍යක්ෂක මණ්ඩලවල සාමාජිකයන් වෙත ලබාදෙන කිසිදු තනතුරකට පත්කිරීම හෝ තෝරා ගැනීම සිදු නොකළ යුතුය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

**6.** මෙම පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කුමන හෝ යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම